## නීති ආධාර කොමිෂන් සභාව - 2011

1. **මූල්‍ය ප්‍රකාශන**

1:1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට නීති ආධාර කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.1.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ව්‍යාපෘති 02කින් ලැබුණු කොම්සම සතු ජීප්රථ 02ක වටිනාකම ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ආ) සේවා නියුක්තිකයන්ගේ සේවා කාලය වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් පාරිතෝෂිත වෙන් කිරීම රු. 76,705කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු වශයෙන් ගිණුම් ගතකල යුතු රු.1,000,000ක මුදලක් මුදල් ශේෂයට එකතු කර ගිණුම් වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ජංගම වත්කම් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් උපලේඛනය නොමැති වීම හේතු කොට ගෙන රු. 16,338,580 ක් වූ වත්කම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10.1 වගන්තිය | නිලධාරියෙකු විදේශ ගත වීම වෙනුවෙන් අග්‍රාමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දින හා අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දින හා අංක අයිඒඅයි / 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝනක හා උපාංග වෙනුවෙන් පරිඝනක වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,902,700 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,423,543ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 9,326,243 ක් වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන රු. 3,113,225 කින් වැඩි වුවත් සමස්ථ වියදම රු. 12,439, 468 කින් වැඩි වීම මෙසේ ඌනතාවයක් ඇති වීමට බලපා තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව සහ එහි ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් නඩු කටයුතු 3783 ක් අවසන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් මධ්‍යස්ථාන 65ක් මගින් පුද්ගලයින් 45,807 ක් සඳහා නීති උපදෙස් ලබා දී තිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර අදාල ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඉදිරිපත් කර තිබුණේ 2012 මාර්තු 28 දින දීය.

### 4.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දින හා අංක පීඊඩී 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛණයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන අතර ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය